**උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය, (අමතර අරමුදල්) - පළාත් සංරචකය - 2017**

----------------------------------------------------------------------------------------------------

උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය, (අමතර අරමුදල්) - පළාත් සංරචකයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2012 නොවැම්බර් 19 දින එළඹි අංක 2890-එස්ආර්අයි(එස්එෆ්) දරණ ණය ගිවිසුමේ IV වැවස්ථාවේ 4.04 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය , වර්තමානයේ පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර උතුරු පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව සහ උතුරු මැද පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, උතුරු පළාත තුළ සහ ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශය සහ දකුණු ප්‍රදේශය අතර මාර්ග සම්බන්ධතාවයන් වැඩිදියුණු කිරීමයි. ව්‍යාපෘතියේ කටයුතු සමන්විත වනුයේ,

**ආ කොටස - පුනරුත්ථාපනය හා ප්‍රතිස්ථාපනය**

--------------------------------------------------

උතුරු පළාතේ පළාත් මාර්ග කිලෝමීටර් 50 ක් පුනරුත්ථාපනය කිරීම සහ තෝරා ගත් පාලම් පුනරුත්ථාපනය සහ / හෝ ප්‍රතිස්ථාපනය කිරීම.

**ඇ කොටස - පුනරුත්ථාපනය හා ප්‍රතිස්ථාපනය**

--------------------------------------------------

උතුරු මැද පළාතේ පළාත් මාර්ග කිලෝමීටර් 70 ක් පුනරුත්ථාපනය කිරීම සහ තෝරා ගත් පාලම් පුනරුත්ථාපනය සහ / හෝ ප්‍රතිස්ථාපනය කිරීම.

ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 4,600 කට සමාන එජඩො මිලියන 34 ක් වන අතර, ඉන් රු.මිලියන 4,058 කට සමාන එජඩො මිලියන 30 ක් මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. 2013 මැයි 31 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කර තිබුණු අතර, 2018 ජුනි 30 දින වන විට නිම කිරීමට නියමිතය. එහෙත් ව්‍යාපෘති කාලසීමාව 2019 දෙසැම්බර් 31 දින දක්වා පසුව දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදී හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත්

විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩ සටහනේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩ සටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද කාර්යයසාධන වාර්තා සහ වැඩි දියුණු කරන ලද මූල්‍ය වාර්තා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුනේද යන බව.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආරම්භක හා අවසාන ශේෂ, විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් හා ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ( ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඈ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුනේ ද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුනේ ද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1** **මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ආපසු ගැනීම් හා ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ගයක් ගෙන තිබූ බව සහ,

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂයේ අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුල හා 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාල වැදගත් සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ අගය | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2017 වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසබැ | 30,00 | 4,058.82 | 538.98 | 2.40 | 309.40 | 29.56 | 3,725.80 |
| ශ්‍රීලංර | 4.00 | 541.18 | 63.18 | 0.41 | 51.40 | 3.40 | 435.20 |
| **එකතුව** | **34.00** | **4,600.00** | **602.16** | **2.81** | **360.80** | **32.96** | **4,161.00** |

### 3.2 භෞතික ප්‍රගතිය

(අ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, අනුරාධපුර දිස්ත්‍රික්කයේ කිලෝමීටර 75.65 ක්වූ පළාත් මාර්ග 07ක් , කිළිනොච්චි දිස්ත්‍රික්කයේ කිලෝමීටර 24.11ක් වූ පළාත් මාර්ග 04ක් සහ මුලතිව් දිස්ත්‍රික්කයේ කිලෝමීටර 24.49ක්වූ පළාත් මාර්ග 02ක් ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළ පුනරුත්ථාපනය කිරීමට අපේක්ෂා කර තිබුණි. කාර්යසාධන වාර්තා වලට අනුව පළාත් මාර්ග පුනරුත්ථාපන කටයුතු 2017 දෙසැම්බර් 31 වන විට අවසන් කර තිබුණි. මාර්ගයන්හි නඩත්තු කටයුතු මාර්ග පුනරුත්ථාපන කටයුතුවල නියැලී සිටින කොන්ත්‍රාත්කරු මගින් 2018 ජුනි 30 දින දක්වා ඉටු කරවා ගැනීමට බලාපොරොත්තු විය.

(ආ) උතුරු මැද පළාතේ තේක්කවත්ත - පුල්එලිය මාර්ගය, දෙකිඹමාන - පරණගල්මිල්ලෑව මාර්ගය, කිරිකෙටුවැව - බණ්ඩරඋල්පන - කපු ගොල්ලෑව මාර්ය සහ යකාවැව - මහ කෝන්ගස්කඩ යන පුනරුත්ථාපනය කරන ලද මාර්ග අධීක්ෂණය කිරීම සඳහා විගණකයින් විසින් 2018 ජුනි 04 දින සිදුකරන ලද ක්ෂේත්‍ර චාරිකාවන්ට අනුව ඉහත සඳහන් මාර්ගයන්හි නඩත්තු කටයුතු කොන්ත්‍රාත්කරුවන් විසින් පැහැර හැර ඇති බව අනාවරණය වූ අතර එම මාර්ගයන්හි ඉරිතැලීම් සහ වලවල් මෙන්ම ගැටිවලට හානි සිදුවීම් ආදිය දක්නට ලැබුණි.

(ඇ) උතුරු මැද පළාතේ කිරිකෙටුවැව - බණ්ඩරඋල්පන - කපුගොල්ලෑව මාර්ගයේ කිලෝමීටර් 20.30 ක්වූ කොටස පුනරුත්ථාපනය කිරීම සඳහා ප්‍රදානය කර තිබූ කොන්ත්‍රාත්තුව 2015 මාර්තු 17 දින වන විට අවසන් කර භාර දී තිබුණි. විගණනයේදී නිරීක්ෂණය වූ පරිදි උක්ත මාර්ගයේ කිලෝමීටර් 19.95 ක් වූ කොටසක් පමණක් සම්පූර්ණ කර තිබූ අතර මුළු කොන්ත්‍රාත් වටිනාකම වූ රු.මිලියන 559.37 ක් වන සම්පූර්ණ මුදලම කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.